සැ. යු. - (i) 2019.10.11 වැනි දින අංක 2145 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2019 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරන කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,146 - 2019 ඔක්තෝබර් මස 18 වැනි සිකුරාදා - 2019.10.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 3050 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 3054 |

*සැ. යු.*-(i) සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ඔක්තෝබර් මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ඔක්තෝබර් මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත් කෙටුම්පත 2019 ඔක්තෝබර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 නොවැම්බර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ඔක්තෝබර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3047 - B 81569— 5,403 (2019/10)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවික ශිල්පීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | වයස | - | 2019 නොවැම්බර් මස 25 වැනි දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24ට නොවැඩි විය යුතු යි. |
| (ඇ) | උස | - | අඩි 5 අඟල් 5 ට නො අඩු විය යුතු යි. |
| (ඈ) | බර | - | කිග්‍රෑ 47 (රාත්තල් 105) ට නොඅඩු විය යුතු යි. |
| (ඉ) | පපුව | - | අඟල් 32 ට නොඅඩු විය යුතු යි. |
| (ඊ) | වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II. |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව) |
| (ඌ) | සිවිල් තත්ත්වය | - | අයදුම්කරුවන් අවිවාහක විය යුතු යි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

3. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) ශ්‍රී ලංකා නාවික තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (නාවික ඉංජිනේරු)
(2) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු)
(3) ජතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු)
(4) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (ස්වයංචලන ඉංජිනේරු)
(5) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (නැව්බඳ අලුත්වැඩියාවන් සහ නැව් ඉදිකිරීම්).

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතු ය. තව ද අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා තිබිය යුතු ය. (විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය).

*සටහන*.- අ.පො.ස. (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකනු නොලබන අතර, ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

4. ඉහත 2 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්‍ෂකයින් සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

5. *සේවා කොන්දේසි :*

(අ) අපේක්ෂකයින් ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ.

(ආ) පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතු යි.

(ඇ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් උපකරණ සපයනු ලැබේ.

(ඈ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව තුළින් සපයනු ලැබේ.

(ඉ) පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඊ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු නාවික හමුදාවේ සේවය සඳහා යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේ දී ම අදාළ ආධුනිකයා විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතු යි.

(උ) සියලුම නාවිකයින් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

6. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.-තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

7. වැටුප් හා දීමනා :

2019.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව -

| | | |
|---|---|---|
| (අ) | මූලික වැටුප | - රු. 27,026.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | - රු. 7,800.00 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| (ඈ) | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඉ) | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඊ) | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00<br>- විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| (උ) | ගැළපුම් දීමනාව | - රු. 480.00 |
| | සම්පූර්ණ වැටුප අවම වශයෙන් | - රු. 39,056.00 |

*සටහන.-* නාවිකයාගේ මූලික වැටුප 2020.01.01 දිනට රු. 30,140.00 වන අතර, වැටුප් වර්ධකයන් පහත පරිදි හිමි වේ.

2016.01.01 - 176 x 5 - 210 x 19
2020.01.01 - 300 x 5 - 370 x 19

(ඌ) නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

(එ) කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(ඒ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට)

(ඔ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු. 2,400 සිට රු. 6,600 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

(ඕ) විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදළ පරිදි අයකරනු ලැබේ.

8. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) පහත දක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතු යි. ඉල්ලුම්පත් 2019 නොවැම්බර් මස 25 වැනි දින 1200 පැයට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්), නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "ආධුනික නාවික ශිල්පීන් බඳවා ගැනීම" යනුවෙන් සටහන් කළ යුතු යි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාරගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195162 මගින් ලබා ගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ/ සංස්ථා/මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම්කර ඇති අංශයන්වලට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය;
(4) මාස 06 ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පලපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(6) මෑතක දී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දනට සේවා යෝජකයාගෙන් (දනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය;
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

9. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහකිරීමට ද යටත් වේ.

10. තෝරාගැනීමේ/සම්මුඛ පරීක්ෂණ ආදිය.

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතු ය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු වන්නේ ය.

(ආ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා :

| *ව්‍යායාමය* | *කාලය (මිනිත්තු/තත්පර)* | *වාර ගණන* |
|---|---|---|
| මීටර් 1600 දිවීම | මිනිත්තු 07 තත්පර 30 | - |
| Push up | මිනිත්තු 02 | වාර 20ක් හෝ ඊට වැඩි |
| Sit up | මිනිත්තු 02 | වාර 15ක් හෝ ඊට වැඩි |
| Arm Bending | මිනිත්තු 02 | වාර 07ක් හෝ ඊට වැඩි |

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(ඈ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඊ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙකු වීමට හේතු වන්නේ ය.

(උ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

*සටහන.-* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

කේ. කේ. වී. පී. එච් ද සිල්වා, ඩබ්ඩබ්වී*, ආර්ඩබ්පී,
ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ
වයිස් අද්මිරාල් නාවික හමුදාධිපති.

නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවිකයින් සඳහා ඉල්ලුම්පත

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචිවීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. ඉල්ලුම්කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. උපන් දිනය :————.

8. වයස ඃ අවුරුදු ඃ . . . . . . ., මාස ඃ . . . . . ., දින ඃ . . . . . (2019 නොවැම්බර් මස 25 වැනි දිනට)

9. උස ඃ . . . . . . . (සෙ. මී.) පපුව ඃ . . . . . . . (සෙ. මී.) බර ඃ . . . . . . (කි. ග්‍රෑ.)

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

11. දිස්ත්‍රික්කය :————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

14. දුරකථන අංකය :————.

15. විවාහක හෝ අවිවාහක බව :————.

16. ස්ත්‍රී පුරුෂ භාවය :————.

17. අධ්‍යාපනය ලැබූ පාසල :————.

18. පාසල හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ඃ

| *පාසලේ/විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව)* |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ)<br>අ. පො. ස. (උ. පෙළ)<br>වෙනත් | | |

19. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර ඃ

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා<br>මව | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේදී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න.) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇඟ බැඳ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. රජයේ දෙපාර්තමේන්තුවකදී හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10-846

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## AQUINAS COLLEGE OF HIGHER STUDIES

වෘත්තීය හා තෘතියික කොමිෂන් සභාවේ ලියාපදිංචි (**P01/0023**)
**NVQ** 5 මට්ටමේ පාඨමාලා
2020 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

- වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03. මූලික උද්භිද විද්‍යාව Basic Botany/ 04. තවාන් පාලනය Nursery Management/05. මූලික පරිසර විද්‍යාව Basic Ecology/06. කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව Agriculture

Engineering/ 07. පැළෑටි සංරක්ෂණය Plant Protection/08. වැවිලි ව්‍යාප්ති අධ්‍යාපනය Extension Education/09. තේ වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Tea Cultivation & Production Processing Technology/10. රබර් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Rubber Cultivation & Production Processing Technology/ 11. පොල් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Coconut Cultivation & Production Processing Technology/12. උද්‍යාන විද්‍යා Horticulture /13. වැවිලි ගණකාධිකරණය Plantation Accounting/ 14. වැවිලි ආර්ථික විද්‍යාව Plantation Economics/15. කළමනාකරණය Management/ 16. කෘෂි වන වගාව Agro Forestry/17. අපනයන කෘෂි භෝග Export Agri Crop/18. උක් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Sugarcane Cultivation & Production Processing Technology/19. කජු වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Cashew Cultivation & Production Processing Technology/20. තල් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Palmyra Cultivation & Production Processing Technology/21. කටුපොල් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Oil Palm Cultivation & Production Processing Technology/22. ගිනිසඩියා වගාව සහ බලශක්ති නිෂ්පාදන තාක්ෂණය Ginisidia Cultivation & Energy Power Technology/23. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research 24. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුළත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන-සතිඅන්ත ඉරිදා

- කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03. මූලික උද්භිද විද්‍යාව Basic Botany/ 04. තවාන් පාලනය Nursery Management/05. ජාන ඉංජිනේරු විද්‍යාව Genatical Engineering/06. ජල විද්‍යාව Hydrology/ 07. ජල කළමනාකරණ තාක්ෂණය Irrigation Management Technology/08. කෘෂි යාන්ත්‍රීකරණ ශිල්ප තාක්ෂණය Farm Machinery Technology 09. කෘෂිකාර්මික උපකරණ පිළිබඳ ශිල්පීය තාක්ෂණය Agriculture Instruments Technology/ 10. කෘෂිකර්ම සිවිල් ඉංජිනේරු විද්‍යාව Agriculture Civil Engineering/11. වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණය Plantation Crop Production Technology/ (පොල් වගාව Coconut Cultivation/රබර් වගාව Rubber Cultivation තේ වගාව Tea Cultivation/ අපනයන කෘෂි බෝග වගාව Export Agri Crop (ගම්මිරිස්/ කරාබුනැටි / කොකෝවා / කෝපි / එනසාල් / කුරුඳු / සාදික්කා/ වැනිලා) /12. උද්‍යාන විද්‍යාව Horticulture /13. කෘෂි මෝටර් කාර්මික විද්‍යා තාක්ෂණය Agri Motor Mechanism Technology 14. පැළෑටි සංරක්ෂණ තාක්ෂණය Plant Protection Technology/15. සත්ත්ව නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු විද්‍යාව Livestock Production Technology/16. වී වගාව සහ සකස් කිරීමේ තාක්ෂණය Paddy Cultivation & Production Processing Technology/17. පසු අස්වනු තාක්ෂණය Post Harvest Technology/18. වෙනත් ක්ෂේත්‍ර බෝග තාක්ෂණය Other Field Crop Technology/19. කළමනාකරණය Management/20. ව්‍යාපාර කළමනාකරණය හා ගොවිපල් කළමනාකරණය Farm Economics & Accounting/21. ව්‍යාප්ති අධ්‍යාපනය Extension Education/22. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යයනය Introduction to Laboratory Research & Agricultural Field Research/ 23. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුළත්ය.)

කාල සීමාවඃ මාස 26 යි. දේශන ඃ සති අන්ත ඉරිදා

- සත්ත්ව පාලනය ඩිප්ලෝමා පාඨමාලාව

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03.තෘණ සහ පෝෂ නිෂ්පාදන තාක්ෂණය Pasture & Fodder/04. සත්ත්ව පෝෂණ මූලධර්ම Animal Nutrition/05. සත්ත්ව ව්‍යුහ විද්‍යාව සහ කායික විද්‍යාව Animal Anotomy & Physiology/06. සත්ත්ව අභිජනනය Animal Breeding/07. කිරි එළදෙනුන් පාලනය Cattle Management/08. බෝග නිෂ්පාදනය Crop Production/09. එළු පාලනය Goat management/10. බැටළු පාලනය මොඩියුලය Sheep Management/11. සූකර පාලනය Swine Management/12. කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව Agriculture Engineering/13. කිරි සහ කිරි නිෂ්පාදන තාක්ෂණය Milk & Dairy Product Technology/14. මස් සහ මස් නිෂ්පාදන තාක්ෂණය Meat & Meat Product Technology/ 15. බිත්තර නිෂ්පාදනය, තත්ත්ව පාලනය සහ බිත්තර රැක්කවීමේ තාක්ෂණය Egg Products & Egg Quality Control & Incubate System Technology/16. සත්ත්ව සෞඛ්‍ය Animal Health/17. මහජන සෞඛ්‍යය Public Health/18. කුකුල් පාලනය Poultry Management/19. මත්ස්‍ය වගාව සහ වෙනත් ජලජීවී වගා පාලනය Fish Culture & Aquaculture/20. ව්‍යාප්ති අධ්‍යාපනය Extension Education 21. කළමනාකරණය Management/22. උද්‍යාන විද්‍යාව Horticulture 23. වෙනත් ගෘහ ආශ්‍රිත සතුන් ප්‍රභේද Other Species of Domestic Animal (හා පාලනය Rabbit management /වටු පාලනය Quail Management/මීමැසි

පාලනය Bee Keeping)/24. ගොවිපල් ආර්ථික විද්‍යාව හා ගොවිපල් කළමනාකරණය Farm Economics & Accounting/ 25. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research/ 26. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුළත්ය.)

කාල සීමාවඃ මාස 26 යි. දේශන-සති අන්ත ඉරිදා

- මල් වගාව හා උද්‍යාන අලංකරණය ඩිප්ලෝමා පාඨමාලාව

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03. මූලික උද්භිද විද්‍යාව Basic Botany/04. උද්‍යාන අලංකරණ මූලධර්ම Principle of Landscape 05. උද්‍යාන අලංකරණයේ ඉතිහාසය හා විකාශනය Landscape History & Development/06. උද්‍යාන අලංකරණයට අදාළ ගුණාත්මක පරිසර විද්‍යාව Landscape Qualitative Ecology/07. තවාන් පාලනය Nursery Management/08. උද්‍යාන අලංකරණයට අදාළ උද්‍යාන විද්‍යාව Landscape Amenity Horticulture 09. උද්‍යාන අලංකරණයට අදාළ රුක් හා ලඳු වගාව Landscape Arboriculture/10. උද්‍යාන අලංකරණයට අදාළ ඉංජිනේරු විද්‍යාව Landscape Engineering/11. ජල සම්පාදන තාක්ෂණය Irrigation Technology/12. මෘදු උද්‍යාන අලංකරණ භාවිත Soft Landscape 13. උද්‍යාන අලංකරණ භාවිත Hard Landscape/14. උද්‍යාන අලංකරණ ආකෘති හා සිතුවම් නිර්මාණ තාක්ෂණය Design Technics for Hard Landscape Item/15. ශාක ප්‍රචාරණය සහ ශාක අභිජනන මූලධර්ම Plant Propagation & Breeding Fundamental/ 16. පැළෑටි සංරක්ෂණය Plant Protection/17. කළමණාකරණ මොඩියුලය Management/18. ව්‍යාපාර කළමනාකරණය හා ගොවිපල් කළමනාකරණය Farm Economics & Accounting/19. මල් වගාව Floriculture/20. උද්‍යාන අලංකරණය සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම Landscape Estimating/21. ආරක්ෂිත බෝග වගා තාක්ෂණය හා හරිතාගාර තාක්ෂණය Protected Cultivation & Green House Technology/22. උද්‍යාන අලංකරණයට අදාළ නීතිමය අධ්‍යනය Landscape of Legal aspects & Landscape Design Management/23. උද්‍යාන නඩත්තු කටයුතු Landscape Maintainers/24. ජාන ඉංජිනේරු විද්‍යාව Genatical Engineering/ 25. වෙනත් විශේෂ උද්‍යාන අලංකරණ භාවිතය Other Item of Landscape (තණ පිඩැලි සිටුවීමේ තාක්ෂණය/පරිනත ශාක ගලවා සිටුවීමේ තාක්ෂණය/බිම් ගඩොල් ඇතිරීමේ තාක්ෂණය/බොන්සායි වගාව)/26. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research/27. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුළත්ය.)

කාල සීමාව : මාස 26 යි.දේශන-සති අන්ත ඉරිදා

- ආහාර විද්‍යාව සහ තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව

01. මූලික රසායන විද්‍යාව Basic Chemistry/ 02. ආහාර රසායනය Food Chemistry/03. ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව Food Micro Biology/ 04. ආහාර අමුද්‍රව්‍ය සහ රස ද්‍රව්‍ය ගබඩාකරණය Food Row Material & Ingredients/05. ආහාර විද්‍යා මූලධර්ම Principle of Food Science/06. ආහාර සංරක්ෂණ තාක්ෂණය Food Preservation Technology/07. ආහාර ඉංජිනේරු විද්‍යා මූලධර්ම Principle of Food Engineering/08. ධාන්‍ය, පලතුරු සහ එළවළු පසු අස්වනු තාක්ෂණය Post Harvest Technology/09. ධාන්‍ය ආහාර රසායනය Cereal Chemistry/10. බේකරි (පෝරණු) කර්මාන්ත තාක්ෂණය Bacery Confectionery Technology/ 11. කිරි සහ කිරි නිෂ්පාදන සකස් කිරීම Milk & Dairy Products Technology/12. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන සැකසීම Fish & Fishery Products Technology/13. මස් සහ මස් නිෂ්පාදන තාක්ෂණය Meat & Meat Products Technology/ 14. මානව පෝෂණය Human Nutrition/15. බීම සහ බීම කර්මාන්ත තාක්ෂණය Distilling & Manufacture of Other Beverages/16. ආහාර ඇසුරුම්කරණය Food Packaging/17. ඓන්ද්‍රිය ඇගයීම් තාක්ෂණය Sensory Evaluation Technology/18. ආහාර විශ්ලේෂණය හා තත්ත්ව පාලනය Food Analysis & Quality Control/19. ආහාර ගබඩාකරණ තාක්ෂණය Food Storage Technology/ 20. ආහාර කර්මාන්තශාලා සනීපාරක්ෂණය හා ආරක්ෂණ තාක්ෂණය Factory Sanitation & Safe Processing Technology/ 21. අපද්‍රව්‍ය බැහැර කිරීම හා ප්‍රයෝජ්‍යකරණය Waste Disposal & Utilization/ 22. ආහාර තත්ත්ව කළමනාකරණ පද්ධති හොඳ නිෂ්පාදන පුරුදු Food Quality Management System/23. ආහාර සකස් කිරීමේ තාක්ෂණය Food Processing Technology/ 24. වෙනත් ආහාර කර්මාන්ත තාක්ෂණය Other Food Confectionery Technology/25. කළමනාකරණය Management/ 26. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research/27. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation(සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුළත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන-සති අන්ත ඉරිදා

සම්මුඛ පරීක්ෂණය : 2020 ජනවාරි 11 සෙනසුරාදා සහ 12 ඉරිදා

අ.පො.ස. (උසස් පෙළ) විෂයයන් තුනක් සමත් අයට සහ අදාළ ක්ෂේත්‍රයන්හි NVQ 4 සහතික ඇති අයට හෝ එම සුදුසුකම් නොමැති විෂයයන් 6 සම්මාන 3ක් සහිතව අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත් අයට හා උසස් පෙළ විෂයයන් එකක් හෝ දෙකක් පමණක් සමත් අයට පාඨමාලාවලට අදළ එක් එක් ක්ෂේත්‍රයන්හි වෘත්තීය පළපුරුදුතාවය අනුව ඉල්ලුම් කළ හැක. 0728173632 ට විමසීම් කර ඇතුළත් වීම සඳහා තොරතුරු දැන ගන්න.

**AQUINAS COLLEGE OF HIGHER STUDIES**
**Colombo 08, Sri Lanka.**

**COURSE CO-ORDINATOR - 0728173632**
**Tel : 2694014,/15, 4618689,0117389115/22 Fax: 0112678463 Website:www.aquinas.lk**

10-594

---

## ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙල - 2020

### සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

පූර්විකාව

ශ්‍රී ලංකාවේ විද්‍යුත් සන්නිවේදන ඉතිහාසයේ පැරැණිම මාධ්‍යය වන්නේ ගුවන්විදුලියයි. ලංකා ගුවන්විදුලි සේවය, 1925 දෙසැම්බර් 16 වන දින එවකට ප්‍රධාන ඉංජිනේරුවරයා වන එඩ්වඩ් හාපර් විසින් ආරම්භ කරන ලදී. මේ වන විට ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සේවය ආරම්භ වී වසර 93 ක් ඉක්මවා තිබේ.

20 වන සියවසේ මුල් භාගයේ ආරම්භ වූ බ්‍රිතාන්‍යයේ සහ ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සේවා, වයසින් බොහෝ සේ සමාන වුවද, බ්‍රිටිෂ් බ්‍රෝඩ්කාස්ටින් කෝපරේෂන් හෙවත් බී. බී. සී. ආයතනය වඩාත් ප්‍රායෝගිකව හා නවතාවයකින් යුතු වැඩසටහන් විකාශ කරමින්, මුළු ලෝකයටම පුවත් සම්පාදනය කරන සහ ආදර්ශ සපයන ගුවන්විදුලි සේවා ආයතනය බවට පරිවර්තනය වී තිබේ. එසේ නමුත් ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සේවා, ලෝකයේ විවිධ ස්ථානවල සිට විකාශය වන බොහෝ ගුවන්විදුලි සේවා හා සංසන්දනය කිරීමේ දී ලබා ඇති ස්ථානය පිළිබඳව සංවාදයට ලක්විය යුතුමය. ඒ පිළිබඳ අවධානය යොමු කැරෙන තරමටම අභිවර්ධනය ද සිදුවන බව අපගේ දැඩි විශ්වාසය යි.

විවිධ හේතු මත මුළු ලොව පුරා බොහෝ ජන කණ්ඩායම් විසින් දශක කිහිපයක් මුළුල්ලේම බී. බී. සී. ආයතනය සලකනු ලබන්නේ ගුවන්විදුලි මාධ්‍යයේ පූර්වාදර්ශය වශයෙනි. බී. බී. සී. ආයතනයේ ප්‍රතිපත්ති, ආචාර ධර්ම, සංකල්ප, නව නිර්මාණ විධි හා ආදර්ශවත් වෘත්තීය ප්‍රවීණතා, ලොව පුරා ගුවන්විදුලි සන්නිවේදනයෙහිලා උපදේශ හා ආදර්ශ සපයන මහා බලවේග බවට පත්වී තිබේ.

අතීතයේ සිට ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සේවා වෘත්තිකයන්ට ඇතැම් විටෙක බී. බී. සී. ආයතනයේ වෘත්තීය අවස්ථා ලැබුණි. එවැන්නන් පෙරළා ශ්‍රී ලංකාවට පැමිණියේ තමන්ට ආගන්තුක සත්කාර සැපයූ ආයතනයෙන් ලද අත්දැකීම්වලින් සරුසාර වූ අධ්‍යාත්ම, පරිකල්පනය හා නිර්මාණශීලීභාවය ද සහිතවය.

මෙවැනි කීර්තිමත් ඉතිහාසයකින් සහ අර්ථවත් පසුබිමකින් අපගේ දේශජ ගුවන්විදුලි සේවයේ ආරම්භය සනිටුහන් වූ අතර, විවිධ කාල වකවානුවලදී අප ගුවන්විදුලි සේවා ද ඒ හා සමාන්තරව වරින් වර මුවහත් විය. එසේ නමුත්, එද සිට මෑතක් වනතුරුම ගුවන්විදුලි ක්ෂේත්‍රයේ නියුක්තිකයන්ගේ නිර්මාණශීලී විශිෂ්ටතා රාජ්‍ය මට්ටමින් පිළිගනු පිණිස ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබිණි.

සිනමා, රූපවාහිනී, සාහිත්‍යය, නාට්‍ය, නර්තන, සංගීත සහ සෙසු කලා හා නිර්මාණ ක්ෂේත්‍රවල, ඒවාටම විශේෂ රාජ්‍ය සම්මාන ප්‍රදාන ක්‍රම තිබිණි. ඒවා විවිධ ආයතන භාරයෙන් රාජ්‍ය උත්සව හා සම්මාන උළෙල ලෙස වාර්ෂිකව පැවැත්විණි. කවර හේතුවක් නිසා හෝ ගුවන්විදුලි සන්නිවේදන සේවය සියල්ලට මඟ හැරී තිබුණු සෙයක් පෙනේ. එසේ නමුත් අද වන විට දශක තුනක තරම්වත් කාලයක් වර්ධනය වී ඇති නානාවිධ ගුවන්විදුලි සේවා ද, එහි නියැළෙන්නන්ද, ගුවන්විදුලි සේවා හරහා සමාජගත කරමින් විකාශ කරනු ලබන විවිධ වැඩසටහන් ද හුදු විනෝදස්වාද සහ පහත් සංවේදන ස්පර්ශ කිරීමට යාම තුළින් පමණක් ම සමාජය තෘප්තිමත් කිරීමට යොමුවීම දක්නට ලැබේ. මෙම තත්ත්වය සීමාකොට එයින් බැහැරව ප්‍රබුද්ධ මනස සන්තර්පනයට හා විවිධ ගුණාත්මක වැඩසටහන් විකාශ කරවීමට දිරිදීම රජයේ වගකීමයි. එසේම එම වැඩසටහන් සහ මානව සම්පත ඇතුළු සියලු නිර්මාණශීලී අංග හා අදළ සේවාවල ප්‍රමිති ස්ථාපනයත්, ගුවන්විදුලිය ඔස්සේ එවැනි ප්‍රමිති මත නිර්මාණය වන සියලු දේ රාජ්‍ය සම්මානයෙන් ඇගැයීමෙන් සුපෝෂණයත්, අංකුර ගුවන්විදුලි කලා නිර්මාණ ශිල්පීන් වෙත යහපත් පෙරනිමිති සටහන් කර තැබීමත් රාජ්‍ය තන්ත්‍රයේ වගකිවයුත්තන්ගේ කාර්යභාරය විය යුතුමය.

මෙවැනි පසුබිමක් යටතේ, රාජ්‍ය යුතුකම් හා වගකීම් පිළිබඳ සංවේදී වූ නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත්, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා කලා මණ්ඩලය

හා ගුවන්විදුලි රාජ්‍ය උපදේශක සභාවත් වාර්ෂිකව ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළ පැවැත්වීමට තීරණය කර තිබේ. මේ, ඒ අනුව පැවැත්වෙන තෙවන ඓතිහාසික ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළයි.

**අරමුණු**

**ප්‍රමුඛ අරමුණ**

විවිධත්වයක් සහිත ගුවන්විදුලි වැඩසටහන් සංවිධාන කරමින් සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ශ්‍රාවක රුචිකත්වය හා බුද්ධිමය නිම්වළලු පුළුල් කරමින්, ජනතාව ඥනනය කරන, ගුණාත්මක හා උසස් රසවින්දනාත්මක වැඩසටහන් විකාශය කෙරෙහි නිර්මාණකරුවන් හා නාලිකා යොමු කරවීම.

**සෙසු අරමුණු**

1. ගුණාත්මක වශයෙන් උසස් ප්‍රශස්ත වැඩසටහන් නිර්මාණය කරන ගුවන්විදුලි කලාකරුවන් ඇගැයීම.
2. ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයේ අභිවර්ධනය උදෙසා අතීතයේ දී අද්විතීය මෙහෙවරක් ඉටුකොට, අදවන විට ඉන් බැහැරව සිටින කෘතහස්ත ගුවන්විදුලි මාධ්‍යවේදීන් අභිවන්දනය.
3. අද වනවිට ගුවන්විදුලි මාධ්‍යයෙහි ලා නිර්මාණ සපයන සහ එකී මාධ්‍ය හදුරමින් සිටින ආධුනික පරපුරේ අංකුර නිර්මාණ ශිල්පීන්, එකී මාධ්‍යකරණය සඳහා පෙළැඹවීමෙන් ලා අවශ්‍ය දිරිගැන්වීම.
4. ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයේ අනාගත අභිවර්ධනය උදෙසා, දැනට ක්‍රියාකාරී ගුවන්විදුලි මාධ්‍යවේදීන් සඳහා මාර්ගෝපදේශකත්වය සැපැයීම.
5. උසස් ගුවන්විදුලි මාධ්‍ය කලාවක් සඳහා අවශ්‍ය පසුබිම සැකැසීම.

**ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙල - 2020**

ශ්‍රී ලාංකේය විද්‍යුත් සන්නිවේදනයේ ගුවන්විදුලියට ඇත්තේ දශක නවයකට අධික ඉතිහාසයකි. එකී මාධ්‍ය නියුක්තිකයන් රාජ්‍ය මට්ටමින් අගයනු වස් නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, සහ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ගුවන්විදුලි උපදේශක සභාව මගින් සංවිධාන කරනු ලබන " ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙල - 2020 " මෙවරද අත්‍යුත්කර්ෂවත්ව පැවැත්වීමට තීරණය කර තිබේ. මෙම සම්මාන උළෙල විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි සියලු රාජ්‍ය හා පෞද්ගලික ගුවන්විදුලි නාලිකා සඳහා විවෘතය.

**තරග අංශ**

1. **ප්‍රවෘත්ති හා කාලීන**

   1.1 හොඳම ප්‍රවෘත්ති සංස්කාරක
   1.2 හොඳම ප්‍රවෘත්ති ප්‍රකාශක (පිරිමි)
   1.3 හොඳම ප්‍රවෘත්ති ප්‍රකාශක (ගැහැණු)
   1.4 හොඳම ගවේෂණාත්මක ප්‍රවෘත්ති වාර්තාව

2. **විවිධ වැඩසටහන්**
   2.1 හොඳම විචිත්‍රාංග වැඩසටහන
   2.2 හොඳම සංගීත වැඩසටහන
   2.3 හොඳම හාස්‍යෝත්පාදක වැඩසටහන
   2.4 හොඳම සාකච්ඡා වැඩසටහන
   (අධ්‍යාපනික, ආගමික, ළමා, කාන්තා, සෞඛ්‍යය, ක්‍රීඩා, පරිසරය, ජාතික සමගිය, සංස්කෘතික හා කලා තේමා සහිත වැඩසටහන් පිළිබඳ විශේෂ අවධානය යොමු කැරේ.)

3. **ගුවන්විදුලි නාට්‍ය**
   3.1 හොඳම ගුවන්විදුලි නාට්‍ය රචක
   3.2 හොඳම ගුවන්විදුලි නාට්‍ය ශිල්පියා
   3.3 හොඳම ගුවන්විදුලි නාට්‍ය ශිල්පිනිය
   3.4 හොඳම ගුවන්විදුලි නාට්‍ය නිෂ්පාදක
   3.5 හොඳම ගුවන්විදුලි නාට්‍ය රචක (ළමා)
   3.6 හොඳම ගුවන්විදුලි නාට්‍ය ශිල්පියා (ළමා)
   3.7 හොඳම ගුවන්විදුලි නාට්‍ය ශිල්පිනිය (ළමා)

4. **වෙනත් සම්මාන**
   4.1 හොඳම සම්ප්‍රවේශක
   4.2 හොඳම සම්බන්ධතා මැදිරි නිවේදක
   4.3 හොඳම සම්බන්ධතා මැදිරි නිවේදිකා
   4.4 හොඳම නාද ශික්ෂණය
   4.5 හොඳම පූර්ව ප්‍රචාරණ ඛණ්ඩය
   4.6 හොඳම ගුවන්විදුලි සජීවී විස්තර ප්‍රකාශක (ගැහැණු/පිරිමි)

5. **ගුවන්විදුලි ප්‍රතිභා ප්‍රණාම සම්මාන**
   (ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයේ අභිවර්ධනය උදෙසා විශිෂ්ට මෙහෙවරක් කළ ප්‍රවීණයන් වෙත ප්‍රතිභා ප්‍රණාම යාවජීව සම්මාන පිරිනැමේ.)

තරග කොන්දේසි හා අදාළ විස්තර
(අයදුම්පත්‍රය පිරවීමට පෙර කියවා බලන්න.)

01. *උපදෙස්*

1.1 ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කොට ප්‍රචාරය කරන ලද ගුවන්විදුලි වැඩසටහන් පමණක් ඉදිරිපත් කළ හැකිය.
1.2 2018 වර්ෂයේ ජූලි මස 01 වන දින සිට 2019 වර්ෂයේ ජූනි මස 30 වන දින දක්වා කාලය තුළ ප්‍රචාරය වූ වැඩසටහන් පමණක් සුදුසුකම් ලබයි.
1.3 සියලු තරගවලට අයදුම් කිරීමට නියමිත අයදුම්පත්‍රය පමණක් භාවිත කළ යුතුයි.
1.4 අයදුම් පත්‍රිකාවේ අංක 1 සිට අංක 5 දක්වා අයදුම්කරු පුරවා අංක 6 තම ආයතනික ප්‍රධානියාගේ / නියෝජිතයාගේ නිර්දේශය සමග ඉදිරිපත් කළ යුතුය.

02. ***සම්මාන සඳහා නියෝජනය***

2.1 සම්මාන පිරිනමනු ලබන්නේ ඉහත සඳහන් කරන ලද තරග අංශ සඳහා පමණි.

2.2 සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය සියලු ගුවන්විදුලි වැඩසටහන් සම්මාන පිරිනැමීම සඳහා සලකා බැලේ.

2.3 ප්‍රධාන සම්මානවලට අමතර නිර්මාණශීලි දයකත්වය සඳහා ජූරියේ විශේෂ සම්මාන හා විශිෂ්ට කුසලතා සම්මාන පිරිනැමීම සඳහා සලකා බැලේ.

03. ***අයදුම් කිරීම***

3.1 එක් ප්‍රවර්ගයකින් (Category) එක් ඉල්ලුම්කරුවෙකුට ඉදිරිපත් කළහැකි වන්නේ වැඩසටහන් එකක් (01) පමණි.

3.2 එක් එක් ප්‍රවර්ගය සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

3.3 හොඳම ගුවන්විදුලි නාට්‍ය රචක සහ හොඳම ප්‍රවෘත්ති සංස්කාරක සඳහා ඉල්ලුම් කිරීමේ දී අදළ පිටපත ඉදිරිපත් කළ යුතුය.

04. ***යොමු කිරීම***

4.1 ඔබ ඉදිරිපත් කරන අයදුම්පත් සමග ගුවන්විදුලි වැඩසටහන් සංයුක්ත තැටි ලෙස භාර දිය යුතුය. ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් හා සංයුක්ත තැටි ආපසු භාර දෙනු නොලැබේ.

4.2 නියමිත ප්‍රචාරයෙන් පසුව, මෙම සම්මාන උළෙලේ තරග අංශ සඳහා විශේෂයෙන් සකසා (Edited) එවන නිර්මාණ විනිශ්චය සඳහා සලකා නොබැලෙන බව අවධාරණය කෙරේ.

4.3 නිර්මාණ භාරගැනීම සතියේ දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා පමණි.

4.4 ඔබගේ සියලු නිර්මාණ,

අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
8 වන මහල,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

යන ලිපිනයට ගෙනැවිත් හෝ ලියාපදිංචි තැපැල් මගින් හෝ නියමිත දිනට පෙර යොමු කළ යුතුය. (විමසීම් 0112 - 872044 - ලසන්ති / තනුෂාන් / වජිර, 0112 - 872031)

05. ***පොදු කොන්දේසි***

5.1 අයදුම්පත් තැපෑලෙන් ගෙන්වා ගැනීමට ඔබගේ ලිපිනය ලියූ මුද්දර කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

5.2 www.culturaldept.gov.lk https://www.facebook.com/culturaldept.gov.lk/?ref=bookmarks යන ලිපින මගින් අයදුම්පත් බාගත හැකියි.

5.3 ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර " 2020 - ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළ " යනුවෙන් සඳහන් කළ යුතුය.

5.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය, 2019 ඔක්තෝබර් මස 30 (නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර නොගැනේ.)

5.5 අයදුම්කරුවන් අදළ නීතිරීති හා තරග කොන්දේසිවලට එකඟ විය යුතු වන අතර, ජූරියේ තීරණය අවසන් තීරණය බව අවධාරණය කෙරේ.

අනූෂා ගෝකුල ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

**ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළ 2020**

***සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව***

*අයදුම්පත්‍රය*

1. ගුවන්විදුලි ආයතනයේ නම :————.
   - 1.1 කෙටි නම :————.
   - 1.2 ලිපිනය :————.
   - 1.3 ස්ථිර දුරකථන අංකය :————.
   - 1.4 ෆැක්ස් :————.
   - 1.5 විද්‍යුත් තැපෑල :————.
   - 1.6 වෙබ් අඩවිය :————.

2. අයදුම්කරුගේ නම :————.

2.1 පෞද්ගලික ලිපිනය :————.

2.2 පෞද්ගලික දුරකථන අංකය :————.

3. අයදුම්කරන තරගය :————.
(විස්තර පත්‍රිකාවේ දැක්වෙන ආකාරයට / උදා : හොඳම ගුවන්විදුලි නාට්‍ය රචක)

3.1 වැඩසටහනේ නම :————.

3.2 ප්‍රචාරය වූ දිනය හා වේලාව :————.

3.3 වැඩසටහනේ ගුවන් කාලය : පැය ............ විනාඩි ............

4. වෙනත් දායකත්ව (නිෂ්පාදනය, පිටපත් රචනය, රංගනය, කථනය, සම්ප්‍රවේශනය, නාද ශික්ෂණය, සංගීත නිර්මාණය ආදියෙන් දායක වූ දක්ෂ අයගේ නාමාවලිය අවශ්‍ය නම්)

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

5. අයදුම්කරුගේ ප්‍රකාශය :

...................................................... වන මම 2020 ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළේ තරග කොන්දේසිවලට එකඟ වන බවත්, ජූරියේ තීරණය අවසන් තීරණය ලෙස පිළිගන්නා බවත් සඳහන් කරමි.

මා විසින් ඉදිරිපත් කර ඇති ..................................................................... නම් වූ ගුවන්විදුලි වැඩසටහන 2020 ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළ සඳහා ඉදිරිපත් කිරීමට හිමිකම හා බලය මා වෙත පැවරී ඇති බවත්, මේ පිළිබඳව හිමිකම් කීමට වෙනත් කිසිවෙකු හෝ ආයතනයක් හෝ නොමැති බවත් සහතික වෙමි. යම් ආකාර ගැටලුවක් මතු වුවහොත් එය සමථ කර දීම මාගේ වගකීමක් ලෙස සලකමි.

අයදුම්කරුගේ නම :————.

අත්සන :————. දිනය :————.

6. ආයතනික නිර්දේශය :
.................................................................................... ඉදිරිපත්කර ඇති ................................ ............ නමැති වැඩසටහන 2018 ජූලි මස 01 වන දින හා 2019 ජූනි මස 30 වැනි දින අතර කාලය තුළ මෙම ගුවන්විදුලි සේවයේ ප්‍රචාරය වූවක් බවත්, ඉහත උලෙළට ඉදිරිපත් කිරීම නිර්දේශ කරන බවත් ප්‍රකාශ කරමි. යම් ආකාරයක ගැටලුවක් මතු වුවහොත් එහි වගකීම මා විසින් භාරගනු ලබන බවත්, එය සමථකර දීම සඳහා මම කටයුතු කරන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ආයතන ප්‍රධානියාගේ/නියෝජිතයාගේ නම :————.

නිල නාමය :————.

අත්සන :————.

දිනය :————.

(නිල මුද්‍රාව)

10-660

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 පෙබරවාරි මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය (වගුව 01) හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(*අ*) විභාග පටිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ.

(වගුව 01)

| *විෂය අංකය* | *විෂය* | *කාලය* | *ලකුණු* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01 | පාසල් පරිපාලනය හා අධීක්ෂණය | පැය 3 | 100 | 40 |
| 02 | පාසල් සැලසුම්කරණය | පැය 3 | 100 | 40 |
| 03 | අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර | පැය 3 | 100 | 40 |

*විෂය නිර්දේශය* :

(i) *පාසල් පරිපාලනය හා අධීක්ෂණය* :
පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද, කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගීත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුභසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(ii) *පාසල් සැලසුම්කරණය* :

සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩල, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝ කාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ජාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(iii) *අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර* :
ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ නව සංකල්පය, අත්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත්වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශනය යන විෂය කරුණු පිළිබඳ දැනුම මැන බැලේ.

03. *විභාගයේ භාෂා මාධ්‍යය* :- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

04. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ඒ අනුව එම ප්‍රතිඵල www.moe.gov.lk අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන බව වැඩිදුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති

පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීතිරීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම්පත්‍ර 2019 නොවැම්බර් මස 18 වැනි දින හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ'' ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

09. (i) ඉල්ලුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු ම විභාගයේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය.

එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. *විභාග ගාස්තු* :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.
(*ආ*) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.
(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ. :-

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 500/- |
| එක් විෂයයක් සඳහා | : | රු. 250/- |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

13. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතීනම් එහි දී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

14. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2019 ඔක්තෝබර් මස 04 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019**

Efficiency Bar Examination for Officers in Class 2 of Sri Lanka Principals' Service -2019

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. (විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
   සිංහල - 2
   දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.)

   (ii) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (*උදා* :- GUNAWARDHANA, H.M.S.K.)

   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :
   (i) පෞද්ගලික :————————————.
   (ii) රාජකාරි :————————————.
   (iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :——————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
   (iv) දුරකථන අංකය : (රාජකාරි) :——————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය :——————.
   (ii) පාසල / කාර්යාලය :——————.
   (iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය :——————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය :
   ☐☐☐☐☐☐☐☐☐☐☐☐

   (ii) උපන් දිනය :
   වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

   (iii) ස්ත්‍රී/පුරුෂ භාවය :
   පුරුෂ - 0
   ස්ත්‍රී - 1 ☐
   (අදාළ අංකය කොටුව තුළ යොදන්න)

6. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

   විෂයය අංක 01- පාසල් පරිපාලනය හා අධීක්ෂණය ☐
   විෂයය අංක 02- පාසල් සැලසුම්කරණය ☐
   විෂයය අංක 03-අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර ☐

   අදාළ විෂයය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

8. මීට ප්‍රථම අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව පැවති කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙහි අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත් නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 33/2014 පරිදි මෙම 2 වන කාර්යක්ෂමතා කඩඉමෙහි පාසල් පරිපාලනය හා අධීක්ෂණය විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එම විෂයය සමත් නම් වසර, සාමර්ථ්‍යය හා මාධ්‍යය ද සඳහන් කරන්න.

| *විෂයය* | *වසර* | *සාමර්ථ්‍යය* | *මාධ්‍යය* |
|---|---|---|---|
| අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය | | | |

9. *විභාග ගාස්තු* :
   (i) ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
   (ii) ගෙවූ මුදල :————.
   (iii) ගෙවූ දිනය :————.
   (iv) ලදුපත් අංකය :————.

*ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.*
*(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)*

10. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *විභාග කොමසාරිස් ජනරාල් :*

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/ පළාතේ නිලධාරියකු බවත් අද දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් කළ බවත් සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග

ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

________,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :________.
දිනය :________.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න)

10-659/1

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 පෙබරවාරි මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා විභාග පටිපාටිය (වගුව 01) හා විෂය නිර්දේශය (වගුව 02) පහත දක්වා ඇත.

(අ) (වගුව 01) - විභාග පටිපාටිය :

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01 | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 | 40 |
| 02 | පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40 |

(ආ) (වගුව 02) - විෂය නිර්දේශය :

| විෂයය අංක | විෂයය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 01 | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, VIII, IX, X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| 02 | පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි. | අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්,රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ වේතන, රාජකාරි දුරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ. |

03. *විභාගයේ භාෂා මාධ්‍යය* :- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

04. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ඒ අනුව එම ප්‍රතිඵල www.moe.gov.lk අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය

ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*- ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර, එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම්පත්‍ර 2019 නොවැම්බර් මස 18 වැනි දින හෝ ඊට ප්‍රථම ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503,කොළඹ'' ලිපිනයට ලැබෙන පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

09. (i) ඉල්ලුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුයි. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාග යට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු ම විභාග යේ පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය.

එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ.

තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. *විභාග ගාස්තු* :

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

(*ආ*) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | : | රු. 500/- |
| එක් විෂයයක් සඳහා | : | රු. 250/- |

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

13. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එහි දී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

14. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2019 ඔක්තෝබර් මස 04 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019**

Efficiency Bar Examination for Officers in Class 3 of Sri Lanka Principals' Service -2019

(කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3 ☐

2. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා* :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.)

(ii) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා* :- GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3. ලිපිනය :
(i) පෞද්ගලික :————————.
(ii) රාජකාරි :————————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) දුරකථන අංකය : (රාජකාරි) :————.

4. (i) විදුහල්පති සේවයේ පන්තිය/ ශ්‍රේණිය :————.
(ii) පාසල / කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය :————.

5. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය : ☐
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

6. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. *ගැසට් නිවේදනයෙහි* 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

විෂයය අංකය 01- ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - ☐
විෂයය අංකය 02- පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි ☐

(අදාළ විෂයය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.)

9. *විභාග ගාස්තු* :
(i) ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
(ii) ගෙවූ මුදල :————.
(iii) ගෙවූ දිනය :————.
(iv) ලදුපත් අංකය :————.

*ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.*
*(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)*

09. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10. *විභාග කොමසාරිස් ජනරාල් :*

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ කොට්ඨාසයේ/ කලාපයේ/ පළාතේ නිලධාරියකු බවත්, අද දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් කළ බවත් සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බව ද / අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

————,
කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පළාත්
අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.

ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අදාළ නොවන වචන කපා හරින්න)

10-659/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.